2 පරිගණක විද්‍යාගාරය ආරක්ෂිතව භාවිතය

පරිගණක විද්‍යාගාරයක් තුළ පහත එක් එක් ක්‍රියාකාරකම් සිදු කිරීම සුදුසු නම් (✔) ලකුණ යොදන්න.

1) භාවිත කළ උපකරණ නියමිත පිළිවෙළට තැබීම ( )
2) සෑම කෙවෙනියකට ම (port) තම පෑන දැමීමට තැත් කිරීම ( )
3) පුටුව කරකවමින් සෙල්ලම් කිරීම ( )
4) ගිනි නිවන උපකරණ පිළිබඳ ගුරුතුමියගෙන් විමසීම ( )
5) තම වතුර බෝතලය හා පාවහන් පිටතින් තබා ඇතුළු වීම ( )
6) බාහිර ආචයන උපාංග වෛරස් පරීක්ෂාවක් නොකර පරිගණකයට සම්බන්ධ කිරීම ( )
7) ගුරුතුමියට නොදන්වා බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයට විදුලි බලය සැපයීම ( )
8) යතුරු පුවරුවේ දුහුවිලි පිස දැමීම ( )

නිවැරදිව පරිගණකය ක්‍රියාත්මක කරන ආකාරය අනුපිළිවෙළින් දැක්වීමට පහත රූපවලට 1 2 3 4 අංක යොදන්න.



LIVEWORKSHEETS

2 පරිගණක විද්‍යාගාරය ආරක්ෂිතව භාවිතය

පරිගණකය ක්‍රියා විරහිත කරන ආකාරය නිවැරදි අනුපිළිවෙළට සකසන්න.

A. නිර්බාධක ජව සැපයුම(UPS) ක්‍රියා විරහිත කිරීම .....

B. සන්දර්ශකය ක්‍රියා විරහිත කිරීම .....

C. කටයුතු කරමින් සිටි වැඩසටහනින් ඉවත් වීම .....

D. වසා දැමීමේ (shutdown) විධානය තේරීම .....

E. විදුලි බලය සැපයූ ස්විචය ක්‍රියා විරහිත කිරීම .....

පහත දැක්වෙන එක් එක් මුරපදය ශක්තිමත් නම් (✔) ලකුණ යොදන්න.

school123 ☐

Nam2005ab# ☐

claSS@21 ☐

amara32 ☐

@m@r@32 ☐

LIVEWORKSHEETS